# Living the Lotus

4
2021

VOL. 187

Buddhism in Everyday Life




## Founder's Reflections

# විවිධ වර්ගයේ හමුවීම්

රැකියා ස්ථානයේ දැන හඳුනන පිරිස සමඟින්, සුපුරුදු රාජකාරිය කිරීම සිතට සැනසුමක් වනවාසේම, කාර්යක්ෂමතාව වැඩිවේ යැයි සිතන නමුත්, ඒ තුල විශාල අවදානමක්ද තිබේ.

'කල යුත්තේ විවිධ වර්ගයේ හමුවීම් සිදු කිරීමයි' සේ, චීනයේ ටැන්ග් රාජවංශයේ නන්කන් පුයුවාන් නම් සෙන් ගුරුතුමා පවසා ඇත. මෙහි සඳහන් විවිධ වර්ගයේ හමුවීම් යනු, බෞද්ධ පොත්පත් වල සඳහන් වන මනුෂ්‍යයන් නොවන විවිධ ස්වරූප වලටය. අපි නිතරම එකම වර්ගයේ හමුවීම් තුල සිරවී සිටින විට තම පුරුදු, තම මනාපයන්ට හා පක්ෂපාතීත්වයට සිරවී එයින් මිදීමට නොහැකිවේ. එයින් මිදීමට නම්, ධෛර්යයෙන් යුතුව, නව හමුවීම් බලාපොරොත්තුවෙන්, නොදන්නා ලෝකය වෙත පිය නැගීම ඉතා වැදගත් වේ.

හුරුපුරුදු බව තුලින් මායමින් චාටුබස් උපදිනවා සේම, තමාගේ නොයෙකුත් නරක හුරුපුරුදු නිරාවරණය වේ. එය තම දියුණුවට බාධාවක් වී, එක් දෙයකට පමණක් සීමා වීමට සිදුවේ. තම අභ්‍යන්තරයේ තිබෙන නොයෙකුත් හැකියාවන් පිටතට විවර වීමට නම්, නව හමුවීම් අත්‍යාවශ්‍ය. එයට හොඳම අවස්ථාව උදාවන්නේ නව පාසල් වාරයේ හා රැකියාවේ ස්ථාන මාරුවීම තුලින්ය. ඒ අවස්ථාවන් වල සිදු වන විවිධ වර්ගයේ හමුවීම් තුලින් සිතට තිගැස්මක් හෝ විටෙක වේදනාවක් ගෙන දෙන්නට පුළුවන්. නමුත් නව හමුවීම් තුල අනිවාර්යයෙන්ම නව සතුටක් තිබෙනවා ලෙසින් විශ්වාසයෙන් සිටින විට, සතුට අප සොයාගෙන පැමිණෙනවා.

නිර්මාතෘ සංකල්පනා ග්‍රන්ථය ඇසුරිනි. 10, P. 44-45

රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය 1938 වර්ෂයේදී නික්යෝ නිවානෝ තුමා හා මියාකෝ නගනුමා මහත්මිය විසින් ස්ථාපිත කරන ලදී. සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය මූලික කරගෙන එහි කටයුතු කරනු ලැබේ. පවුල තුලත්, කාර්යාලයේදීත්, සමාජයේදීත් බුදු දහම ජීවිතයට බද්ධ කර ගෙන, සාමාකාමී ලෝවක් බිහි කිරීමට ප්‍රාර්ථනා කර කටයුතු කරන එකමුතුවකි.

වර්තමානයේදී නිචිකෝ නිවානෝ ප්‍රධානීතුමාගේ මූලිකත්වයෙන්, සාමාජික සාමාජිකාවන් සෑම ධර්ම ව්‍යාප්තියේ යෙදෙමින් අත් වැල් බැඳගෙන සෑම රටකම සාම ක්‍රියාකාරකම් වල නියැලී සිටියි.


Living the Lotus
Vol. 187 (April 2021)

Senior Editor: Keiichi Akagawa
Editor: Kensuke Osada
Copy Editors: P.A.D. Somapala,
Ruklanthi Palipana, Sahan Chamara

*Living the Lotus* is published monthly
by Rissho Kosei-kai International,
Fumon Media Center, 2-7-1 Wada,
Suginami-ku, Tokyo 166-8537, Japan.
TEL: +81-3-5341-1124
FAX: +81-3-5341-1224
Email: living.the.lotus.rk-international@kosei-kai.or.jp


Living the Lotus-Buddhism in Everyday Life (සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය තුල ජීවත්වෙමු - එදිනෙදා දිවියට බුදු දහම බද්ධ කර ගනිමු.) යන තේමාව තුල, එදිනෙදා ජීවිතයට සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ කියාදීම් බද්ධ කර ගෙන මඩෙහි පිපෙන්නාවූ ලස්සන නෙලුම් මලක් සේ තම ජීවිතය සමෘධිමත් කරගෙන, එලෙසම වැඩි වටිනාකමින් යුතු තත්වයට පත් විය යුතුය යන ප්‍රාර්ථනය ගැබ් වී ඇත. මෙම සඟරාව මගින් ලෝකය පුරා ව්‍යාප්ත වී සිටින්නාවූ සාමාජික සාමාජිකාවන් එදිනෙදා දිවියට බුදුදහම බද්ධ කරගෙන කටයුතු කරන්නාවූ අයුරු අන්තර්ජාල මාර්ගයෙන් බෙදාහැරීම සිදු කරනු ලැබේ.



*President's Message*

# මේ මොහොත තුළ ජීවත්වීම

නිචිකෝ නිවානෝ තුමා
ප්‍රධානී, රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය

## ප්‍රයෝගික පුහුණුව තුලින් බුදු බවට

අප්‍රේල් මාසයේ 8 වෙනිදින, ජපානයේ සිදුහත් බෝසතාණන්ගේ උප්පත්තිය සමරණවා. බෞද්ධ පුරාවෘත්ත වලට අනුව සිදුහත් බෝසතාණන් උපතලබා එසැණින් 'මම ලොවට අග්‍ර වෙමි, මම ලොවට ජ්‍යේෂ්ඨ වෙමි, මම ලොවට ශ්‍රේෂ්ඨ වෙමි, මේ මාගේ අවසන් උපතවේ' ලෙසින් ප්‍රකාශ කළ බව සදහන් වේ. බහුලව මෙම වාක්‍ය බුදුන් වහන්සේව වර්ණනා කිරීම සදහා වු වෘතාන්තයක් වුවද, එයින් බුදු දහමේ සාරය විදහා දක්වා ඇතැයි යනුවෙන් මම පිළිගනිමි.

මෙම වාක්‍ය ගැන තවත් පුද්ගලයන් පවසන්නේ, 'අපි හැමෝම මේ ලෝකයේ අසමසම ජීවින් කොටසක්' බව විදහා දැක්වෙන බවයි. බුදුන් වහන්සේ පමණක් නොව, සෑම පුද්ගලයෙකුම ඉපදුන මොහොතේ සිටම, අන්‍යයන් සමග සංසන්දනය කල නොහැකි විශිෂ්ට පැවැත්මක් වේ. එබැවින්, තම ජීවිතයේ විශිෂ්ටත්වය අවබෝධ කරගෙන ජිවත්විය විය යුතු ආකාරය බුදු දහමෙන් කියාදෙන නිසා, ඉහත වාක්‍යයද එයට පාදක කරගෙන ඇතිබව පැවසිය හැකිය.

එසේම, 'පුද්ගලයෙකු විසින් තවත් පුද්ගලයෙකුව දුකින් මුදවා ගන්නා ආකාරය' බුදු දහමේ කියා දෙන නිසාද, ඉහත වාක්‍ය ඉතා ගැඹුරු අරුතකින් යුතුවෙයි.

මනුෂ්‍ය ආත්මයකින් උපතලබා බුදුන් වහන්සේ විසින් සත්‍යාවබෝධ ලබාගත්තා, එම ධර්මය පාදක කරගෙන අපිද දුකින් මිදෙනවා. එසේ දුකින් මිදුනු පුද්ගලයන් තමා අවට කරදරයට පත්ව සිටින පුද්ගලයන්ව දුකින් මුදවා ගන්නවා....... එය බුද්ධ කාලයේ සිටම නොකඩවා සිදුවිය. එම බුදු දහමේ ඉතිහාසයට අනුවද අන්‍යයන්ව දුකින් මුදවා, තමන්ද දුකින් මිදුන මනුෂ්‍යය පැවැත්මේ විශිෂ්ටත්වය මොනවට විදහා දක්වයි.

බුදුන් වහන්සේ දේශනා කළ පරිදි තවත් වැදගත් කරුණක් වන්නේ, 'කෙනෙකු වසලයකු හෝ බ්‍රහ්මණයෙකු වන්නේ උපතින් නොව, කරන ක්‍රියාව අනුවයි' වන බැවින්, මනුෂ්‍යයන්ගේ විශිෂ්ටත්වය තව තවත් දිප්තිමත් වන්නේ එදිනෙද කරන ක්‍රියාවෙන් වේ. එසේම, දෝගෙන් සෙන් ගුරුතුමා විසින් 'ෂුෂෝ ඉත්තෝ' (shusho itto) ලෙස සදහන් කර ඇති වදනේ අරුත වන්නේ, ධර්ම පුහුණුවේ ක්‍රමඋපායෙන් සත්‍යාවබෝධය ලබනවා නොවේ, හුදෙක්ම ධර්මය පුහුණුව සත්‍යාවබෝධ ලබාඇති බවට සාක්ෂිය වන බවයි. එනම්, ධර්මානුකූලව එදිනෙද ජීවිතය ගත කරමින් ආධ්‍යාත්මික දියුණුව ලබා ගැනීම බුදුන් බවට පත්වී ඇතී බවේ සාක්ෂිය වනවාසේම, එම ප්‍රායෝගිය පුහුණුව තුලින් මෛත්‍රියේ හා කරුණාවේ හදවත පුළුල් කර ගැනීම ධර්ම මාර්ගයේ ගමන් කිරීම වේ.



# වසන්තයේ මඳ නල සේ

සද්ධර්ම පුණ්ඩරීක සුත්‍රයේ 23 වන පරිච්ඡේදය වන 'භෛෂ ජ්‍යරාජ බෝධිසත්වයන්ගේ පෙර භවය' තුලදී, බුදුන් වහන්සේ දේශනා කල වදූල ධර්මය, ආත්ම පරිත්‍යාගයෙන් යුතුව ප්‍රයෝගිකව පුහුණුවීමේ වැදගත්කම හා එම ස්වරූපය දකින් විශාල පිරිසකගේ සිත සම්‍යක් සම්බෝධිසයට නැඹුරු වන බව පෙන්වා දුන්හ. තවත් පැහැදිලිව පවසනවා නම්, 'අන්‍යයන් ප්‍රථමයෙන්' යන හැඟීමෙන් ලාභ හෝ අලාභ මත පදනම් නොවී තම ශරීරය භාවිතා කරමින්, හදවතින් හා යහපත් වදන් අන්‍යයන් ගැන සිතා ප්‍රයෝගික පුහුණුවේ යෙදෙයි නම් තමා සතුටට හා ප්‍රීතිය පත්වනවා සේම, එය අන්‍යයන්ගේ දුකින් මිදීමට පාදක වන ආලෝකය බවට පත්වේ.

තවත් සරලවම පවසනවා නම්, 'ධර්ම පුහුණුව යනු අන්‍යයන් වෙනුවෙන් සේවය කිරිමයි' ලෙසින් ප්‍රසිද්ධ වදනක්ද ඇත. ශාන්තිදෙව් නම් ඉන්දියාවේ ප්‍රසිද්ධ භික්ෂුව, මෛත්‍රියේ හා කරුණාවේ හදවත ක්‍රියාවන් පෙන්නුම් කිරීමයි ආධ්‍යාත්මික දියුණුව වන්නේ ලෙසින්ද සදහන් කර ඇත. එසේම හජිමෙ නකමුරා බෞද්ධ විශාරද තුමා විසින්ද 'ධර්මය දැනුම ලෙස පමණක් ගබඩා කර ගැනිම කිසිම අරුථක් නොමැත. අපගේ ක්‍රියාවලින් එය මූර්තිමත් කල යුතුය' සේ සැකවින් සදහන් කරයි.

ධර්මය දැනුම ලෙස පමණක් ගබඩා කර ගැනීම අර්ථ විරහිත ක්‍රියාවක්ම නොවනවා වුවත්, දුක් කරදර වලට මුහුණ දී සිටින පුද්ගලයන් වෙතට තම දෑත දිගු කර ප්‍රායෝගිකව එයින් මුදවා ගැනීම හොදම ක්‍රමය යැයි සිතමි.

එසේම, එයින් ඇති වු සතුට තුලින් තමාගේ හා අන්‍යයන්ගේ ජීවිතයේ වටිනාකමට දෑස් විවර කරගත් පුද්ගලයන්ද සිටියි. එසේ මනුෂ්‍යයන්ව කථාර්තය දෙසට යොමු කිරීමට එක් මෛත්‍රියේ හා කරුණාවේ ක්‍රියාවක් පමණක් වුවද ප්‍රමාණවත් වේ. එම 'මෛත්‍රියේ හා කරුණාවේ උපාය කෞෂල්‍ය' බුදුන් වහන්සේ ප්‍රාර්ථනා කල ධර්ම ව්‍යාප්තියේ පදනම වනවා සේම, මෙම කොරෝනා අන් සියල්ලටත් වඩා 'මෛත්‍රිය හා කරුණාව' අත්‍යාවශ්‍ය වේ.

ඒ වෙනුවෙන් හැකි උපරිමයෙන් නිරහංකාරව ජීවත්වීම වැදගත් ලෙසින් ඉහත සදහන් කළ ශාන්තිදෙව් නම් ඉන්දියාවේ භික්ෂුව පවසයි. එහි අරුත නම්, ලැබෙන සුළු දෙයින් පවා සෑහීමකට පත්ව, සෑම දෙයකටම කෘතවේදී වෙමින් සරළ දිවිපැවැත්මක් ගත කිරීම අමතක නොකල යුතුය.

නොබුත්සුනා සසකි මහතාගේ කවියක, 'වසන්තයේ මඳ නල සේ, පැමිණෙන්නෙමි දොරටුව අබියසට, හරවන්නට වෙනතකට, සන්තාපයේ වේදනාවන්' සේ සදහන් වේ. මෙම කවියේ සදහන් පරිදි සියළුදෙනාගේ දුක් වේදනාවන් සිහිල් කිරීමට මෛත්‍රියේ හා කරුණාවේ හදවතින් වසන්තයේ මඳ නල සේ හමා යමු.

From *Kosei*, April 2021.

# ‘තේරුම් ගැනීමේ’ වැදගත්කම

**මසහිරෝ නෙමොතෝ මහතා**
**විධායක නිලධාරි, ලේකම් අංශය, රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය**

මෙම සෙප්පෝව, 2020 වර්ෂයේ 12 වන මස 08 වන දින බුදුන්වහන්සේ බුද්ධත්වයට පත්වීම නිමිති කරගෙන දයිසේදෝවේදී පැවැත්වූ උත්සවයේදී ඉදිරිපත් කරන ලද්දකි.

මම 1954 වර්ෂයේ නොවැම්බර් මස 29 වන දින නෙමොතො පවුලේ වැඩිමල් පුතා ලෙස ෆුකුෂිමා ප්‍රාන්තයේ ඉවකි ප්‍රදේශයේදී උපත ලැබුවා. දෙමාව්පියන් සහ වැඩිමල් සහෝදරිය වාගේම කුඩාකල සිටම අම්මාගේ මවත් අප සමග ජීවත්වූ නිසා පවුලේ 5 දෙනෙක් වුනා. මාමා නිසා අපි රිෂ්ෂෝ කෝසෙයිකායි සංවිධානය සමග 1959 වර්ෂයේදී ඉබරකි ධර්ම ශාඛාවේදී සාමාජිකත්වය ලබා ගත්තා.

සාමාජිකතවය ලබා ගැනීමෙන් පසු මාගේ දෙමව්පියන් ඉතාමත් උනන්දුවෙන් වැඩකරන සාමාජිකයන් බවට පත්වුනා. අම්මා, ඉබරකි ධර්ම ශාඛාවේ පළමු තරුණ නායක ලෙසත්, ඉන්පසු වයස 60 දී විශ්‍රාම යනතෙක් ශිබුචෝ ලෙසත්, තවදුරටත් නොසගි අධ්‍යක්ෂක තුමාගේ (නොසකි නොබුයො, ඉබරකි ශාඛාවේ හිටපු කියෝකයිචෝ සාන්, හිටපු අධ්‍යක්ෂක) සහායක රාජකාරි වලද නිරත වුනා. තාත්තා ධර්මය පිළිබඳ ඉතාමත් උද්යෝගයකින්, උදේ සවස සූත්‍ර සජ්ජායනයේදී නොකඩවා සද්ධර්ම පුණ්ඩරික සූත්‍ර ය සජ්ජායනා කරමින්, රැකියාවද සිදුකරන ගමන්, අම්මා ශිබුචෝ ලෙස රාජකාරි කරන එක් ප්‍රදේශයක ප්‍රාදේශීය ධර්ම නායක ලෙසත්, ධර්ම ශාඛාවේ උපදේශකයෙකු ලෙසත්, වැඩිහිටි කණ්ඩායමේ නායක ලෙසත් කටයුතු කලා. මෙවන් දෙමව්පියන්ගේ දරුවෙකුවූ මම කුඩා කාලයේ සිටම ධර්ම ශාඛාවේ වැඩසටහන් වලට සහභාගි වුනා

මම මුල සිටම, ඉංජිනේරුවෙක් වෙනවා යැයි සිහින දකිමින් විශ්ව විද්‍යාලයේදීත් ඉංජිනේරු විෂය හැදෑරුවා. නමුත් පාසල් කාලයේ දී කෝසෙයි කායි සංවිධානයේ පාසල් ශිෂ්‍ය කණ්ඩායමේ නායකයා ලෙස පත්වූ පසු, සද්ධර්ම පුණ්ඩරික සූත්‍රය තව තවත් ඉගෙන ගන්න ඕනා යැයි සිතමින්, නොසකි අධ්‍යක්ෂක තුමා සහ මාමාගේද සහයෙන්, ගකුරින් පාසල් අධ්‍යාපනයට අවස්ථාව උදාකර ගත්තා. ගකුරින් පාසලේ තුන්වන වසරේදී තිබෙන ශාඛා ධර්ම පුහුණුවේදී, මම ඕස්ට්‍රේලියාවේ සිඩ්නි වල නිව් සවුත් වේල්ස් ධර්ම ශාඛාවේදී මාස 6 ක කාලයක් ධර්ම පුහුණුව ලැබුවා. එම කාලයේ, ඉංග්‍රීසි භාෂාව හැසිරවීමට නොහැකිව දුක් විඳිමින්, අනෙක් අතට මම නිසා අන් අයටද කරදර වෙනවා යන හැඟීමෙන් සිටියා. පසුතැවීම වසන්තයක් බවට පත්වී, ගකුරින් අධ්‍යාපනයෙන් පසු අන්තර්ජාතික ධර්ම ව්‍යාප්තිය සිදු කිරීමට අධිෂ්ඨාන කිරිම නිසා, අන්තර්ජාතික මූලස්ථානයේ රාජකාරි කිරීමට අවස්ථාව උදාවුනා.

ඉන්පසු පාසල් කාලයෙ ධර්ම ශාඛාවේදී දැන හඳුනගත් වර්තමානයේ මාගේ බිරිඳ සමග විවාහ වුනා. ආගමික නිදහස සඳහා වූ ජාත්‍යන්තර සමුලුව වන (ෂ්සෘත) ෆ්‍රෑන්ක්ෆර්ට් මහ ලේඛම් කාර්‍යාලයේ නියෝජිතයෙකු ලෙස මාව මූලස්ථානයේ තෝරා ගත් නිසා, 1983 දී පැවැත්වූ (ෂ්සෘත) තෝකියෝ වැඩසටහන සඳහා සූදනම් වීමේ කටයුතුවල අවුරුදු දෙකහමාරක් පමන නිරත විය. ජපානයට නැවත යාමට සූදනම් වන විට, එකල නියගය හේතුවෙන් මිලියන ගනනක් ජනයා කුසගින්නෙන් මියගිය අප්‍රිකානු රටවල් කිහිපයකට, ජපන් රජය හා පෞද්ගලික ආධාර සමීක්ෂන කණ්ඩායමක් යවනු ලැබුවා. මමත් එම කණ්ඩායමේ සාමාජිකයෙකු ලෙස පැරීසියේදී එක් වී, විශාල ලෙස හානිවූ එම රටවල් 8 ක, සති 3ක කාලයක් ගතකරමින් සමීක්ෂනය කර නැවතත් ජපානයට පැමිණියා.



*දයිසෙයිදෝවේදී සෙප්පෝව ඉදිරිපත් කරන නෙමොතෝ මහතා*

එම අප්‍රිකානු සංචාරය, එවකට මාගේ ජීවිතය අංශක 180 වකින් වෙනස් කරනු ලැබුවා. මම කිසිසේත් උනන්දු නොවූ තුන්වන ලෝකයේ රටවල් ගැන වයස 29 දී මාගේ ඇස් ඇරෙන්නට වුනා. ලෝකයේ යතාර්ථය දැක ඒ ගැන අවබෝධයෙන් සිටීමේ වැදගත්කම වටහා ගන්න එය අවස්ථාවක් වුනා. තව සරණාගත ගැටලු වලට, 'අප්‍රිකාවට බ්ලැන්කට් යවන වැඩසටහන්' වලට සහභාගි වීමෙන් පසු, නික්යෝ නිවානෝ තුමාගේ කරුණාවෙන්, ජිනීවා වල එක්සත් ජාතීන්ගේ සරණාගතයන් පිළිබඳ මහාකොමසාරිස් කාර්යාලයේ (ඔහ්‍යසෘ) වසර 3 ක කාලයක් සේවය කරමින්, සරණාගතයන් සඳහා ආහාර බෙදීදීමේ ක්‍රියාවලින් වල නිරතවී, 1989 වර්ෂය අවසානයේදී නැවතත් රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානයේ රාජකාරි භාරගත්තා.

ජිනීවා බලා පිටත්වන විට නික්යෝ නිවානෝ තුමාගේන් මේවන් උපදෙසක් ලැබුනා. 'ජපානය නියෝජනය කරමින් එක්සත් ජාතීන්ගේ සංවිධානයට යන නිසා , බෝධිසත්ව වරයෙකු ලෙස ආත්ම විශ්වාසයෙන් යුතුව, නිර්භයව කටයුතු කරන්න. ඉතාම උනන්දුවෙන්, උපරිමයෙන් කටයුතු කරන්නේ නම්, අනිවාර්යයෙන්ම ඔබගේ උදව්වට කවුරුන් හෝ, එන නිසා භය නැතිව ගිහින් එන්න' යැයි සිනාමුසු මුහුණින් මාව පිටත් කලා. නික්යෝ නිවානෝ තුමාගේ එම උපදේශය ජීවිතකාලයටම ඉතාමත් වටිනා උපදෙසකි.

එක්සත් ජාතීන්ගේ සංවිධානයේදී ගොඩක් දේ ඉගෙන ගත්තා. කාර්යාලයේ ජේෂ්ඨයන් සරණාගතයින්ට 'පවුල' හෝ 'යහළුවා' යන වචන භාවිතා කරනවා මිස ඔවුන්ට 'සරණාගතයන්' යැයි කීවේ නැහැ. එම නිසා මට දැනුත් ඔවුන්ට නිකම්ම 'සරණාගතයන්' යැයි කීමට නොහැකිව, ඔවුන්ට 'සරණාගත සාන්' යැයි කියනවා. එක්සත් ජාතීන්ගේ සංවිධානයෙන් ඉගෙනගත් දේ තුලින්, අන් අයව තේරුම් ගැනීමට වඩා වැදගත් වන්නේ කුමක්දැයි හොඳින් අවබෝධ කරගත්තා යැයි සිතනවා. 'තේරුම් කරගැනීම' යන්න ඉංග්‍රීසි භාෂාවෙන් 'Understand' යනුවෙන් හැඳින්වෙනවා. එය 'Under' සහ 'Stand' යනුවෙන් වචන දෙකකට වෙන්කල හැක. ව්‍යාකර්නානුකූලව එයට අර්ථයක් නොමැති වුවත්, මට මෙම වචනය රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානය තුල භාවිතා වන 'යටහත් පහත් බව' යැයි හැගුනි. වෙනත් ආකාරයකින් කියනවා නම් අන් අයට ගෞරව කිරීම, ඒ වාගේම අන් අයගෙන් ඉගෙන ගනිමු යන 'නිහතමානී ස්වරූපයේ' වැදගත්කම කොපමනදැයි කියා දෙන බව සිතෙනවා.

එතැන් සිට වසර 13 ක් මූලස්ථානයේ සෝමාලියා සරණාගතයන්, යුගොස්ලව්යානු සරණාගතයන්, ඇෆ්ගනිස්තාන් සරණාගතයන් වැනි අයට ආධාර සැපයීමේ ක්‍රියාකාරකම් හා එක්වරු දනමය ක්‍රියාවලිය, ඒ වාගේම ජාත්‍යන්තර ආගමික සහයෝගිතා ක්‍රියාකරකම් වැනි දේ වලට මම සහභාගි වුනා. කුඩා කල සිටම ධර්ම ශාඛාවේදීත්, දෙමව්පියන්ගෙනුත් 'යටහත් පහත් බව' යන වචනය මගේ කනට ඇසුනා සේම එය ලෝකයේ වඩා වැදගත් ඉගැන්වීමක් බව මට සිතුනා. එය මම ඉගෙනගත් වටිනා දෙයකි. 'අන් අයට යටහත් පහත්ව ගෞරව කිරීම' එය මනුෂ්‍යයෙක් ලෙස ඉතාමත්ම වැදගත් මූලික ජීවන රටාවකි. එය කිරීමට අමාරු දෙයක් වුනත්, දැනුත් මම එම අභියෝගය වෙනුවෙන් සටන් කරමින් සිටිනවා.

1997 වර්ෂයේ අවසාන සමයේ නිච්කෝ නිවානෝ තුමා සමග බොස්නියාවේ බර්සෙගොවිනා වල ආගමික නායකයන් හමුවට ගිය සංචාරය මට කිසිදිනක අමතක නොවේ. බොස්නියාවේ ප්‍රධාන ආගම් හතරේ ආගමික නායකයන් හමුවී ඔවුන් සමග වෙන් වෙන් වශයෙන් කතාකරන විට විනාඩු 4 ක් 5 යනවිට ඔවුන්ගේ හදපතුලේ තිබෙන දුක අඬන ගමන් කියන්නට වුනා. නිච්කෝ නිවානෝ තුමා මුළු හදවතින්ම ඔවුන්ට සවන් දුන්නා. එම නිසා ඔවුන් දැඩි විශ්වාසයකින් හදවතේ තිබූ දේ සම්පූර්ණයෙන්ම පැවසුවා යැයි සිතනවා.

ඊට පසු වසර වන 1998 දී නිච්කෝ නිවානෝ තුමා ගේ 'හදවත හා මනස සංවර්ධනය' යන පොත ප්‍රකාශයට පත්කරා, ඒ තුල 'සවන්දීම' යන්නෙහි ඇත්තම තේරුම, තමා යන හැඟීමෙන් මිදී සවන් දීමයි සේ සඳහන් කර තිබුනා. බොස්නියාවේ වලදී මම දැක්කේ නිච්කෝ නිවානෝ එම ස්වරූපයයි. එම නිසා ආගමික නායකයන් හතරදෙනා හදවත විවර කරමින්, නිච්කෝ නිවානෝ තුමාව විසින් ජපානයට පැමිණෙන ලෙස කල ආරාධනය පිලිගත් බව මට ඒත්තු ගැනී මාව වෙව්ලන්නට වුනා.

ඒ අනුව 1998 වසරේ මාර්තු මස 5 වන දින රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානයේ 60 වන සංවත්සරය සමරන උත්සවයේ, දයිසේදෝවේදී නික්යෝ නිවානෝ තුමා, නිච්කෝ නිවානෝ තුමා, කෝෂෝ නිවානෝ තුමිය, ඒ වාගේම බොස්නියාවේ සිට පැමිණි ප්‍රධාන ආගමික නායකයන් හතරදෙනා ඇතුළුව ලෝක ආගමික නායකයන් 50 කට වැඩි පිරිසක් සංවත්සරය සැමරීමට හැකිවුනා.

මම 2001 වසරේ සිට 2010 වසර දක්වා, සුව්උරා ධර්ම ශාඛාවේ කියොකයිචෝ ලෙසත්, කෝබෙ ධර්ම ශාඛාවේ කියොකයිචෝ ලෙසත් රාජකාරි කලා. කියොකයිචෝ ලෙස පත්වීම ලබන අවස්ථාවේ නිච්කෝ නිවානෝ තුමාගෙන් 'කියොකයිචෝ කෙනෙක් යනු සාමාජිකයන්ගේ බුද්ධ ශක්තියට ගෞරව කිරීමේ රාජකාරිය පැවරී ඇති කෙනෙක්' යැයි පැවසුවා. සුව්උරා ධර්ම ශාඛාවේ 50 වන සංවත්සර උත්සවය, කෝබෙ ධර්ම ශාඛාවේ 60 වන සංවත්සර උත්සවය, න්‍යෂ්ඨික අවි අහෝසි කිරීමේ 'ARMS DOWN' වැනි වැඩසටහන් සඳහා සාමාජිකයන් සමග එකට එක්වී තෙදොරි, මිච්බිකි සඳහා කටයුතු කල ආකාරය මට පැහැදිළිව

මතක තිබේ. ජේෂ්ඨ කියොකයිචෝ සාන්ලාගෙන් 'ධර්ම ව්‍යාප්තිය සඳහා ගෙයින් ගෙට ගොස් තෙදොරි කිරීම', 'දුක තිබෙන නිසා තමා තුල තිබෙන බුද්ධ ශක්තිය වටහා ගැනීමට හැකිවේ' වැනි දේ ඉගෙන ගෙන, සාමාජිකයන්ගෙන්ද ඇත්තටම ගොඩක් දේ ඉගෙන ගැනීමට හැකියාව ලැබුනා. එයට බොහොම ස්තුතියි. මාගේ ද අඩු පාඩුකම් තිබෙන නිසා, සාමාජිකයන් අපහසුතාවයට පත් වූ අවස්ථාද තිබුනා නම් මම එයට සමාව අයදිනවා.

මූලස්ථානයට නැවත පැමිණි පසු ආගමික සහයෝගීතාවය, රාජ්‍ය සාම ව්‍යාපරය, එක්වරු සාම අරමුදල වැනි දේ ක්‍රියාවට නංවමින්, වර්තමානයේ ලේකම් වරයෙකු ලෙසත්, ආගමික නායක සාම සමුළුව 'ක්‍ෂෘජ' කාර්යාලයේ රාජකාරි කටයුතු කරමින් සිටිනවා. විශේෂයෙන් මෙම වසර 10 ක පමන කාලය නිච්කෝ නිවානෝ තුමා සහභාගී විය යුතු බාහිර වැඩසටහන් වලින් වැඩි හරියක් කෝෂෝ නිවානෝ තුමියගේ ප්‍රධානත්වයෙන් සිදු වනවා. එසේම ඉතා හොඳින් දේශීය හා ජාත්‍යන්තර වශයෙන්, ආගමික සංවාද, සහයෝගිතා, සේම ලෝක සාමය වෙනුවෙන් කටයුතු කරමින් සිටිනවා.

මම විදේශිය සිසුවෙකු ලෙස ඉගෙන නොතිබුනත්, ඉංග්‍රීසි භාෂා පසලක උපාධිදරියෙකුවත් නොවේ.මම ඉංග්‍රීසි භාවිතා කරමින් රාජකාරි කිරීමට පටන් ගෙන අවුරුදු 7 ක පමන පළපුරුද්දක් තිබෙන නමුත්, එයත් ජර්මනිය සහ එක්සත් ජාතීන්ගේ සංවිධානයේදී විවිධ ජාතීන් සමග ඉංග්‍රීසි භාෂාවෙන් කතා කරන පරිසරයක් තිබූ නිසාය. 'පිරිසිදු ඉංග්‍රීසි භාෂාව' මට හුරු පුරුදු නැත. මාගේ ගම වන ඉවගි ප්‍රදේශයේ භාෂා උච්චාරණ රටාව තවමත් වෙනස් කරගත නොහැකිය. මාගේ ගමේ භාවිතා කරන වචන පිළිබඳ අභිමානයකින් සිටින නිසා එය වෙනස් කරන්න ඕනා යැයිද සිතෙන්නේ නැත. එම නිසා මම භාවිතා කරන ඉංග්‍රීසි භාෂාවද ෆුකුෂිමා ප්‍රදේශයේ උච්චාරණයට හැඩගැසුනු ඉංග්‍රීසි වේ.

නික්යෝ නිවානෝ තුමාගේ මීට පෙර පරිවර්තන කටයුතු කල මගේ ප්‍රධානියා වන මසුචෝ නෙසු මහතා විසින්, 'නෙමොතො සාන්. අපි ඉංග්‍රීසි ජාතිකයන් නොවන නිසා, සුද්දෙක් වගේ අමාරුවෙන් ලස්සනට ඉංග්‍රීසි කතාකරන්නට ඕනා නැහැ. පරිවර්තනයේ කරන පවසන දේ අන් අයට වැටහෙනවා නම් ඒ ඇති' යනුවෙන් පැවසූ උපදෙස තවමත් සිහියට නගමින් රාජකාරි කටයුතු කරමින් සිටිනවා. එයින් නිච්කෝ නිවානෝ තුමාටත්, කෝෂෝ නිවානෝ තුමියටත් මාගේන් සිදුවූ අපහසුතාවයන්ට මම සමාව අයැද සිටිනවා. සමහර අවස්ථා වලදී තරුණ අයගෙන් ඉංග්‍රීසි ශබ්ද කරන ආකරය ඉගෙන ගනිමින් උනන්දුවෙන් කටයුතු කරනවා.

වසර 10 කට ආසන්න කාලයක්, කෝෂෝ නිවානෝ තුමිය සමග ධර්ම කටයුතු වල යෙදෙන බැවින් මට ඉතාමත් වටිනා වැකි ඉගෙන ගැනීමට හැකියාව ලැබී තිබෙනවා. මම ඒවායින් ටිකක් ඔබලා සමග බෙදාහදා ගන්න සිතනවා.

* සාමාන්‍ය දේවල් ලෙසින් සිතන සෑම දෙයකටම ස්තුතිවන්ත වීම.

* දුර්වල මිනිසුන් සමග හා කටහඬ නොමැති පුද්ගලයන් සමඟ එකට ජීවත්වීම.

* ආරක්ෂිත ස්ථාන වල පමණක් නොසිට, ප්‍රශ්න ගැටළු ඇති තැන් වලටද යන්න.

* අපගේ වගකීම හා තමාගේ වගකීම යන දෙකම වැදගත්කොට සළකන්න.

* අවදානමක් නොමැති බෝධිසත්ව චර්යයාවක් නොමැත.

* අසීරු අවස්ථා වලදී, තවත් අසීරු දෙයක් වැඩිකර ගන්න.

'බුදුන් වහන්සේ බුද්ධත්වයට පත්වීම සැමරීමේ උත්සවය', බුදුන් වහන්සේ බුද්ධත්වයට පත්වීම තුලින්, අතීතය, වර්ථමානය හා අනාගතයේ මිනිසුන්ට, එසේම ලෝකයේ සිටින සෑම කෙනෙකුටම සෙත ශාන්තිය ලබා දෙන්නවූ මේ දිනයේ මමත් සෑම දෙනාටම සුභ ප්‍රාර්ථනා කරනවා. මාව මෙතක් කාලයක් මිච්චිකි කල බුදුන් වහන්සේටත්, නික්යෝ නිවානෝ තුමාටත්, නිච්කෝ නිවානෝ තුමාටත්, කෝෂෝ නිවානෝ තුමියටත්, මාගේ දෙමව්පියන්ටත්, පවුලේ අයටත්, ඥාතීන්ටත්, යහලුවන්ටත්, මාගේ සගයින්ටත්, ඒ වාගේම සාමාජිකයන් සියළු දෙනාටමත් හදවතින්ම ස්තුතිවන්ත වෙමින්, කෘතවේදී හදවතින්, මින් ඉදිරියටද බෝධිසත්ව චර්යයාවේ යෙදීමට අධිෂ්ටාන කරමි.

වැඩිමහල් හා එකම පුතා ලෙස මම මූලස්ථානයේ රැකියාව කිරීම නිසා, ගමේ ජීවත්වන මගේ අක්කාගේ පවුලේ අය, අවුරුදු 92 ක් සහ 93 වන මාගේ දෙමව්පියන්ව හොඳින් රැකබලාගත්තා. අම්මා මතකය අඩුවීමේ රෝගයෙන් පිඩාවිදින නිසා මේ වසරේ වැඩිහිටි සත්කාරසේවා ස්ථානයකට යොමුකලා. තාත්තා සතියකට කිහිප වතාවක් කෙටි කාලීනව එම ස්ථානයේ නැවතීමට යනවා. මීට අමතරව අක්කාත් සැමියාත් මහ ගෙදර නැවතී තාත්තාව රැකබලා ගන්නවා. මම ගිය මාසය අවසානයේ විශ්‍රාම ගිය නිසා, ෆුකුෂිමා වලට ගොස් දෙමව්පියන්ව රැකබලා ගන්නට සිතා සිටියත්, අක්කාත් සැමියාත් 'ෆුකුෂිමා ගැන හිත කලබල කරගෙන සිතන්න ඕනා නැහැ, මූලස්ථානයේ කටයුතු ඉදිරියටත් හොඳින් සිදු කරන්න' යැයි පැවසූ නිසා, මම ඉතාම කැපවීමෙන් මූලස්ථානයේ රාජකාරි කටයුතු සිදු කිරීමට බලාපොරොත්තු වෙනවා.

සියළුදෙනාටම බොහොම ස්තුතියි.

# සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ
## සාරාංශය හා වැදගත් කරුණු

කර්තෘ: නික්යෝ නිවානෝ

## සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය
## 25 වන පරිච්ඡේදය, අවලෝකිතේෂ්වර බෝධිසත්වයන් වහන්සේ



මෙම පරිච්ඡේදයේදී, අක්ෂමතීය බෝධිසත්වයන් වහන්සේ විසින් 'අවලෝකිතේෂ්වර බෝධිසත්වයන් වහන්සේව ඒ නමින් හඳුන්වන්නේ කුමන හේතුවක් නිසාදැයි' කරන විමසීම හා එයට අදාලව බුදුන් වහන්සේ කරන පැහැදිලි කිරීම ගැන සඳහන් වේ.

### සද්ධර්මය තුලින් සත්‍යාවබෝධය ලැබ, මෛත්‍රිය හා කරුණාවෙන් දුකින් මුදවාලීම

මෙම පරිච්ඡේදයේ තිබෙන්නාවූ වැදගත්ම කරුණ වන්නේ, අවලෝකිතේෂ්වර බෝධිසත්වයන්ගේ ශක්තිය පිටතින් පැමිණි බව සිතනවා වුවත්, එය එසේ නොවේ, සැබෑ ප්‍රඥාවේ සංකේතය වන බවයි. තවත් පැහැදිලිව පවසනවා නම්, 'සෑම සියළු සංසිද්ධියක්ම මැද මාවතකින් අනුගමනය කිරීමේ ප්‍රඥාවයි.' එය මිනිසාට අනුගත කරනවා නම්, සෑම මනුෂ්‍යයයෙකුගේම සමානාත්මතාවයෙන් යුතුබව පිලිගෙන, පෙනුමේ වෙනස්බවද පිලිගෙන, ඕනෑම පුද්ගලයෙකු, ඕනෑම අවස්ථාවකටම ගැලපෙන අසීමාන්තික වූ ප්‍රඥාවෙන් කටයුතු කිරීමයි. සෑම සියළුදෙයකම යථාර්තය පිළිබඳ දේශනා කරන සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ සත්‍ය වූ ධර්මය එයවේ.

අවලෝකිතේෂ්වර බෝධිසත්වයන් වහන්සේ එවැනි ප්‍රඥාවකින් යුතු වනවා සේම, ඕනෑම පුද්ගලයෙකුගේ දුක් කරදර තමාගේ කරගැනීමේ මහා කරුණාවේ හා මෛත්‍රියේ හදවතකින් යුතු වේ.

අපි නියමාකාරයෙන් දුකින් මිදීමට නම්, සද්ධර්මය දැනගෙන, සද්ධර්මය ගැන සිතමින්, සද්ධර්මයට අනුකූලව කටයුතු කළ යුතුවේ. එසේම, අන්‍යයන්ව දුකින් මුදවා ගැනීමට නම්, මෛත්‍රිය හා කරුණාවෙන් තම ආත්ම පරිත්‍යාගය සිදුකර, එම පුද්ගලයන්ව ධර්ම මාර්ගයට ගැනීම හැර වෙන ක්‍රමයක්ද නොමැත. නමුත් මෙම පරිච්ඡේදයේදී, අවලෝකිතේෂ්වර බෝධිසත්වයන් වහන්සේ ගැන නිතරම සිහියේ තබාගන්නේ නම් සත් ආකාරයේ දුක් කරදර වලින් මිදීමට හැකිබව දේශනා කරයි.

නමුත් පුරාණයේ මිනිසුන්ට එය ග්‍රහණය කරගැනීමට අපහසු වූ නිසා, අවලෝකිතේෂ්වර බෝධිසත්වයන් වහන්සේගේ තීක්ෂණ බුද්ධිය, ලෝකයේ සෑම හඬක්ම ඇකිය හැකි වගේම, ලෝකයේ සෑම ක්‍රියාවක්ම හා සෑම සියළු සත්වයන්ගේම ආශාවන් ගැන දන්නා බැවින් ස්වරූප 33 කින් මූර්තිමත් වී, මහා මෛත්‍රිය හා කරුණාවේ හදවතින් සෑම දුක් වේදනාවක්ම දුරු කරලමින්, සද්ධර්මයට ප්‍රතිචාර දැක්වීමෙන් දුකින් මිදෙන බව සඳහන් කලහ.

### අවලෝකිතේෂ්වර බෝධිසත්වයන් වාගේ වීමට

වර්තමානයේ ජීවත්වන අපි, අවලෝකිතේෂ්වර බෝධිසවත්වයන් වහන්සේගේ ඉමහත් වූ පෞරුෂය සිතින් මවාගෙන, ඒ වාගේ විය යුතුයු සේ ප්‍රාර්ථනාවක් තබාගත යුතුය. එහි ශක්තියෙන් කුමන ආකාරයේ දුක් කරදර පැමිණියත් අනිවාර්යයෙන්ම එයින් ගොඩඒමට හැකිවේ. එසේම, දුක් කරදර වලින් පිඩාවට පත්ව සිටින පුද්ගලයන්ව දුටුවිට, ඔවුන්ව දුකින් මුදවා ගැනීමට දෑත දිගු නොකර සිටීමට නොහැකිවේ.



## අනන්ත වූ මහා මෛත්‍රිය විද්‍යාමාන වීම

අවලෝකිතේශ්වර බෝධිසත්වයන් මෙන් වීමට තිබෙන ආශාව යනු අනන්ත වූ මහා මෛත්‍රිය වේ. එසේම, ලෝකයේ ඕනෑම තැනකට, ඕනෑම ගැටළුවකදී, ඕනෑම අවස්ථාවකදී, අවශ්‍ය ස්වරූපයෙන් අවලෝකිතේශ්වර බෝධිසත්වයන් වහන්සේ පෙනී සිටිමින්, සෑම මනුෂ්‍යයෙකුවම දුකින් මුදවා ගනී ලෙසින් අරුත් ගැන්වේ.

මෙලෙසින් අවලෝකිතේශ්වර බෝධිසත්වයන් මෙන් වීමට තිබෙන ප්‍රාර්ථනය, පවුල තුලද, සමාජය තුලද, රටවල් තුලද, තවල් පුළුල්ව ලෝකය පුරාම, නොයෙක් තත්වයන්ට ගැලපෙන ආකාරයට, නොයෙක් පුද්ගලයන්ගේ දුක් වේදනාවන් හා ප්‍රශ්න ගැටළු වලට ඉතා ප්‍රයෝගිකව දුකින් මිදීමේ දැත දිගු කරමු යන ප්‍රාර්ථනාවද වේ. ඒ ආකාරයට ක්‍රියාකිරීම අවලෝකිතේශ්වර බෝධිසත්වයන් වහන්සේගේ අන්‍යයන්ව දුකින් මුදවා ගන්නා මහා මෛත්‍රීයේ හදවතද වේ.

මෙම අන්‍යයන්ව දුකින් මුදවා ගැනීමේ ක්‍රියාව, කුමන තත්වයකදී වුවද, කුමනා ආකාරයේ කුඩා දෙයකදී වුවද, එක් කෙනෙක් හෝ වැඩියෙන් ප්‍රයෝගිකව පුහුණුවන්නේ නම්, අනිවර්යයෙන්ම පවුල හා සමාජය මෙන්ම, ලෝක සාමයද සිහිනයක් නොවේ. එලෙසින් අනන්ත වූ මහා මෛත්‍රිය විද්‍යාමාන වීම මෙම පරිච්ඡේදයේ වැදගත්ම කරුණක් වේ.

## පුණ්‍ය මහිමය හා සෘද්ධි බලය උද්දීපනය වන්නේ සද්ධර්මය හා එහි ප්‍රායෝගික පුහුණුවෙනි

මෙම පරිච්ඡේදයේදී නොසලකා සිටිය නොහැකි කරුණ වන්නේ, අවලෝකිතේශ්වර බෝධිසත්වයන් වහන්සේගේ අති මහත් වූ පුණ්‍ය මහිමය හා සෘද්ධි බල ශක්තිය ගැන පැහැදුනු අක්ෂමතීය බෝධිසත්වයන් වහන්සේ විසින් තම ගෙල පලදනාව අවලෝකිතේශ්වර බෝධිසත්වයන් වහන්සේට පිරිනැමුහ. එය භාරගත් බෝධිසත්වයන් වහන්සේ දෙකට බෙදා බුදුන් වහන්සේට හා ප්‍රභූතරත්න තථාගතයන් වහන්සේට පූජා කලහ. එයින් අදහස් කරනුයේ, අවලෝකිතේශ්වර බෝධිසත්වයන් වහන්සේ සතු අති මහත් වූ පුණ්‍ය මහිමය හා සෘද්ධි බලය, සද්ධර්මය (ප්‍රභූතරත්න තථාගතයන් වහන්සේ) හා එම ධර්මය දේශනා කල පුහුණුවන බුදුන් වහන්සේගේ පිහිටෙන් ලැබුණ බවයි. මෙයට අනුකූලව ‘අවලෝකිතේශ්වර බෝධිසත්වයන් වහන්සේට වන්දනා කිරීමෙන් පමණක් දුකින් මිදෙනවා’ ලෙසින් සිතීම තව දුරටත් අදාල නොවන බව පැහැදිලි වේ.



# සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය
# 26 වන පරිච්ඡේදය, ධාරණී බෝධිසත්වයන් වහන්සේ

මෙම පරිච්ඡේදයේදී, මේ දක්වා සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ දේශනාවන් ගැන ඉමහත් සතුටට පත්වූ පුද්ගලයන්, 'අනිවාර්යයෙන්ම මෙම ධර්මය ආරක්ෂා කරමි' සේ අධිෂ්ඨාන කලවිට, එම ආරක්ෂාව සඳහා දේශනා කල ධාරණී මන්ත්‍රය ගැන සඳහන් වේ. මෙම සම්පූර්ණ පරිච්ඡේදයම සංස්කෘත භාෂාවෙන් සඳහන් වේ.



මෙම ධාරණී තුල දෙවියන්ගේ නම් හෝ ගුණ නාමයන් ගැන සඳහන් වෙනවාසේම, එම දෙවියන්ට ආමන්ත්‍රණය කිරීම ගැන සඳහන් වේ.

## පරිවර්තනය කළ නොහැකි වචන 5

මෙම පරිච්ඡේදය තුල සංස්කෘත වචන ඒ ආකාරයෙන් සඳහන් වන තැන් තිබෙනවා. සංස්කෘත භාෂාවෙන් චීන භාෂාවට පරිවර්තනය සිදු කල කුමාරජීවයන් හා පිරිස විසින් එම සංස්කෘත වචන චීන භාෂාවට පරිවර්තනය නොකිරීම හොඳයැයි තීරණය කර, වචන වල උච්චාරනයේ හඬට ගැලපෙන චීන කන්ජි රූප අක්ෂර භාවිතා කර, හිතාමතාම මුල් භාෂාවෙන් තැබූහ. එම පරිවර්තනය කළ නොහැකි වචන වර්ග 5 වන්නේ,.

1. ඉන්දියානු ශාක, සත්ව විශේෂ හා පුරාවෘත්ත වල නම්.

2. එක් වචනයක බොහෝ අරුත් ගැන්වීම් තිබෙන නිසා, එක වචනයකින් පරිවර්තනය කිරීමෙන් මුල් අදහස සම්පූර්ණ වශයෙන් බැහැර වන වචන.

3. රහස්‍ය වචන හා අප්‍රකාශිත වදන් පරිවර්තනය කිරීම තුලින්, එහි අන්තර්ගත ගුප්ත බලය හීන වන වචන.

4. පැරණි සිරිත් විරිත් වලට අනුකූලව ඉතිරිව ඇති සම්ප්‍රදායික වචන.

5. පරිවර්තනය කිරීම තුලින් නියම අරුත බැහැර වන වචන යන 5 ස් වර්ගය වේ.

නික්යෝ නිවානෝ තුමා විසින් රචිත『සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ සාරාංශය හා වැදගත් කරුණු』ග්‍රන්ථය ඇසුරෙනි
කෝසෙයි මුද්‍රණ ආයතනයේ ප්‍රකාශනයකි. 2016, P208-P215



# Director's Column

## කොරෝනා වසංගතය නිමාවී, කේදිනක හෝ සතුට උදාවේ

අන්තර්ජාතික මුලස්ථාන ප්‍රධානී
කෙයිචි අකගාවා මහතා

ජපානයේ බුදුන් වහන්සේගේ උප්පත්තිය සමරණ මෙම මාසයේ, නිචිකෝ නිවානෝ තුමාගේ ධර්ම පණිවුඩයේද බුදුන් වහන්සේගේ උප්පත්තියේ අරුථ දක්වන අතරම, අපගේ ජීවිතයේ වටිනාකම හා එම වටිනා ජීවිතයෙන් උපරිම ප්‍රයෝජන ගත හැකිවන්නේ බුද්ධ මාර්ගයේ ගමන් කිරීමෙන් බවද ඉතා සරළව පැහැදිලි කරදෙයි.

එසේම බුදු දහමේ හරය අවබෝධ කරගනිමින් හා තමා දුකින් මිදෙන ගමන් අන්‍යයන්වද දුකින් මුදවා ගනිමින් ජීවිතය ගත කිරීමට හැකිවේ නම් එය බෞද්ධයෙකු ලෙස ලබන උපරිම සතුට වේ. බුදු දහම එදිනෙද ජීවිතයට ප්‍රයෝගිකව යොද ගනිමින් ලබන අධ්‍යාත්මික දියුණුව, දැනටමත් අපි බුදු බව ලබා තිබෙන බවට ඇති ශාක්ෂියද වනබව එම ධර්ම පණිවුඩයේ සදහන් වුවත්, ඒ වනතෙක් මට එය සිතාගැනීමට නොහැකිවිය.

ගිහි බෞද්ධයන් වන අපට තිබෙන තිබෙන පුහුණුව නම්, 'යහපත් දේ හදවතින්ම නැවත නැවත සිදු කිරීම', 'ආධ්‍යාත්මික දියුණුව නොකඩවා සතුටක් ඇති වනතෙක් සිදු කිරීම, තමා වෙනස් වන තෙක්ම හා නැවත උප්පත්තියක් ලැබුවත් ආධ්‍යාත්මික දියුණුව ඇතිකර ගැනීම' වේ. මෙහි සදහන් වන ආධ්‍යාත්මික දියුණුව වන්නේ, 'බෝධිසත්ව චර්යයාවයි'. එනම් තමා වෙනුවෙන් පමණක් නොව අන්‍යයන් වෙනුවෙන්ද උපාය කෞෂල්‍යාත්මක මෛත්‍රි හා කරුණා පුහුණුවේ යෙදීම වේ.

සීත සෘතුව අවසානයේ වසන්තයේ මඳ නල හමනවා සේම, කොරෝනා වසංගතය නිමාවී කවද හෝ සියළු ලෝක වාසීන්ට සැනසුම හා සතුට උදාවීමේ දිනය වැඩි ඈතක නොවේ යැයි විශ්වාස කරමි.



We welcome comments on our newsletter Living the Lotus: living.the.lotus.rk-international@kosei-kai.or.jp

# Rissho Kosei-kai: A Global Buddhist Movement




**Rissho Kosei-kai Buddhist Church of Hawaii**
2280 Auhuhu Street, Pearl City, HI 96782, USA
TEL: 1-808-455-3212 FAX: 1-808-455-4633
Email: sangha@rkhawaii.org URL: http://www.rkhawaii.org

**Rissho Kosei-kai Maui Dharma Center**
1809 Nani Street, Wailuku, HI 96793, USA
TEL: 1-808-242-6175 FAX: 1-808-244-4625

**Rissho Kosei-kai Kona Dharma Center**
73-4592 Mamalahoa Highway, Kailua-Kona, HI 96740, USA
TEL: 1-808-325-0015 FAX: 1-808-333-5537

**Rissho Kosei-kai Buddhist Center of Los Angeles**
2707 East First Street, Los Angeles, CA 90033, USA
POBox 33636, CA 90033, USA
TEL: 1-323-269-4741 FAX: 1-323-269-4567
Email: rk-la@sbcglobal.net URL: http://www.rkina.org/losangeles.html

Please contact Rissho Kosei-kai Buddhist Center of Los Angeles
**Rissho Kosei-kai Buddhist Center of Arizona**
**Rissho Kosei-kai Buddhist Center of Colorado**
**Rissho Kosei-kai Buddhist Center of San Diego**
**Rissho Kosei-kai Buddhist Center of Las Vegas**
**Rissho Kosei-kai Buddhist Center of Dallas**

**Rissho Kosei-kai of San Francisco**
1031 Valencia Way, Pacifica, CA 94044, USA
POBox 778, Pacifica, CA 94044, USA
TEL: 1-650-359-6951 Email: info@rksf.org

Please contact Rissho Kosei-kai of San Francisco
**Rissho Kosei-kai of Sacramento**
**Rissho Kosei-kai of San Jose**

**Rissho Kosei-kai of New York**
320 East 39th Street, New York, NY 10016, USA
TEL: 1-212-867-5677 Email: rkny39@gmail.com URL: http://rk-ny.org

**Rissho Kosei-kai of Chicago**
1 West Euclid Ave., Mt. Prospect, IL 60056, USA
TEL: 1-773-842-5654
Email: murakami4838@aol.com URL: http://rkchi.org

**Rissho Kosei-kai of Fort Myers**
URL: http://www.rkftmyersbuddhism.org

**Rissho Kosei-kai Dharma Center of Oklahoma**
2745 N.W. 40th St., Oklahoma City, OK 73112, USA
POBox 57138, Oklahoma City, OK 73157, USA
TEL: 1-405-943-5030 FAX: 1-405-943-5303
Email: rkokdc@gmail.com URL: http://www.rkok-dharmacenter.org

**Rissho Kosei-kai Dharma Center of Denver**
1255 Galapago St. #809 Denver, CO 80204, USA
TEL: 1-303-446-0792

**Rissho Kosei-kai Dharma Center of Dayton**
617 Kling Drive, Dayton, OH 45419, USA
URL: http://www.rkina-dayton.com

**The Buddhist Center Rissho Kosei-kai International of North America (RKINA)**
2707 East First St., Suite #1, Los Angeles, CA 90033, USA
TEL: 1-323-262-4430 FAX: 1-323-269-4567
Email: dharmasa@rksabuddhistcenter.org
URL: http://rksabuddhistcenter.org

**Rissho Kosei-kai Buddhist Center of San Antonio**
(Address) 6083 Babcock Road, San Antonio, TX 78240, USA
(Mail) POBox 692148, San Antonio, TX 78249, USA
TEL: 1-210-558-4430 FAX: 1-210-696-7745
Email: dharmasanantonio@gmail.com
URL: http://www.rkina.org/sanantonio.html

**Rissho Kosei-kai of Seattle's Buddhist Learning Center**
28621 Pacific Highway South, Federal Way, WA 98003, USA
TEL: 1-253-945-0024 Email: rkseattlewashington@gmail.com
URL: http://buddhistlearningcenter.org

**Rissho Kosei-kai of Vancouver**
Please contact RKINA

**Risho Kossei-kai do Brasil**
Rua Dr. José Estefno 40, Vila Mariana, São Paulo-SP, CEP 04116-060, Brasil
TEL: 55-11-5549-4446, 55-11-5573-8377
Email: risho@rkk.org.br URL: http://www.rkk.org.br

**Risho Kossei-kai de Mogi das Cruzes**
Av. Ipiranga 1575-Ap 1, Mogi das Cruzes-SP, CEP 08730-000, Brasil

**在家佛教韓国立正佼成会**
〒 04420 大韓民国 SEOUL 特別市龍山區漢南大路 8 路 6-3
6-3, 8 gil Hannamdaero Yongsan gu, Seoul, 04420, Republic of Korea
TEL: 82-2-796-5571 FAX: 82-2-796-1696

**在家佛教韓国立正佼成会釜山支部**
〒 48460 大韓民国釜山廣域市南區水營路 174, 3F
3F, 174 Suyoung ro, Nam gu, Busan, 48460, Republic of Korea
TEL: 82-51-643-5571 FAX: 82-51-643-5572

**社團法人在家佛教立正佼成會**
台湾台北市中正區衡陽路 10 號富群資訊大厦 4 樓
4F, No. 10, Hengyang Road, Jhongjheng District, Taipei City 100, Taiwan
TEL: 886-2-2381-1632, 886-2-2381-1633 FAX: 886-2-2331-3433

**台南市在家佛教立正佼成會**
台湾台南市東区崇明 23 街 45 號
No. 45, Chongming 23rd Street, East District, Tainan City 701, Taiwan
TEL: 886-6-289-1478 FAX: 886-6-289-1488
Email: koseikaitainan@gmail.com

**Rissho Kosei-kai South Asia Division**
Thai Rissho Friendship Foundation
201 Soi 15/1, Praram 9 Road, Bangkapi, Huaykhwang, Bangkok 10310, Thailand
TEL: 66-2-716-8141 FAX: 66-2-716-8218

**Rissho Kosei-kai of Kathmandu**
Ward No. 3, Jhamsikhel, Sanepa-1, Lalitpur, Kathmandu, Nepal

**Rissho Kosei-kai of Kolkata**
E-243 B. P. Township, P. O. Panchasayar, Kolkata 700094, India

**Rissho Kosei-kai of Kolkata North**
AE/D/12 Arjunpur East, Teghoria, Kolkata 700059,
West Bengal, India

**Rissho Kosei-kai of Bodhgaya Dharma Center**
Ambedkar Nagar, West Police Line Road, Rumpur, Gaya-823001,
Bihar, India

**Rissho Kosei-kai of Patna Dharma Center**
Please contact Rissho Kosei-kai of Kolkata

**Rissho Kosei-kai of Central Delhi**
77 Basement D.D.A. Site No. 1, New Rajinder Nagar,
New Delhi 110060, India

**Rissho Kosei-kai of Singapore**
Please contact Rissho Kosei-kai International

**Rissho Kosei-kai of Phnom Penh**
W.C. 73, Toul Sampaov Village, Sangkat Toul Sangke, Khan Reouseykeo,
Phnom Penh, Cambodia

**RKISA Rissho Kosei-kai International of South Asia**
Thai Rissho Friendship Foundation
201 Soi 15/1, Praram 9 Road, Bangkapi, Huaykhwang, Bangkok 10310, Thailand
TEL: 66-2-716-8141 FAX: 66-2-716-8218

**Rissho Kosei-kai of Bangkok**
Thai Rissho Friendship Foundation
201 Soi 15/1, Praram 9 Road, Bangkapi, Huaykhwang, Bangkok 10310, Thailand
TEL: 66-2-716-8216 FAX: 66-2-716-8218 Email: info.thairissho@gmail.com

**Rissho Kosei Dhamma Foundation**
No. 628-A, Station Road, Hunupitiya, Wattala, Sri Lanka
TEL: 94-11-2982406 FAX: 94-11-2982405

**Rissho Kosei-kai of Polonnaruwa**
Please contact Rissho Kosei Dhamma Foundation

**Rissho Kosei-kai Bangladesh**
85/A Chanmari Road, Lalkhan Bazar, Chittagong, Bangladesh
TEL: 880-2-41360470

**Rissho Kosei-kai Mayani**
Mayani Barua Para, Mirsarai, Chittagong, Bangladesh

**Rissho Kosei-kai Damdama**
Damdama Barua Para, Mirsarai, Chittagong, Bangladesh

**Rissho Kosei-kai Satbaria**
Village: Satbaria Bepari Para, Chandanaih, Chittagong, Bangladesh

**Rissho Kosei-kai Chendhirpuni**
Village: Chendhirpuni, P.O.: Adhunogar, P.S.: Lohagara, Chittagong,
Bangladesh

**Rissho Kosei-kai Raozan**
Dakkhin Para, Ramzan Ali Hat, Raozan, Chittagong, Bangladesh

**Rissho Kosei-kai Laksham**
Village: Dhupchor, Laksham, Comilla, Bangladesh

**Rissho Kosei-kai Dhaka**
408/8 DOSH, Road No 7 (West), Baridhara, Dhaka, Bangladesh

**Rissho Kosei-kai Cox's Bazar**
Ume Burmize Market, Tekpara, Sadar, Cox's Bazar, Bangladesh

Please contact Rissho Kosei-kai Bangladesh
**Rissho Kosei-kai Patiya**
**Rissho Kosei-kai Ramu**
**Rissho Kosei-kai Aburkhiln**

**Buddiyskiy khram "Lotos"**
4 Gruzinski Alley, Yuzhno-Sakhalinsk 693005, Russia
TEL: 7-4242-77-05-14

**Rissho Kosei-kai of Hong Kong**
Flat D, 5/F, Kiu Hing Mansion, 14 King's Road, North Point, Hong Kong, China

**Rissho Kosei-kai Friends in Shanghai**

**Rissho Kosei-kai of Ulaanbaatar**
(Address) 15F Express Tower, Peace avenue, khoroo-1, Chingeltei district,
Ulaanbaatar 15160, Mongolia
(Mail) POBox 1364, Ulaanbaatar-15160, Mongolia
TEL: 976-70006960 Email: rkkmongolia@yahoo.co.jp

**Rissho Kosei-kai of Erdenet**
Please contact Rissho Kosei-kai International

**Rissho Kosei-kai di Roma**
Via Torino, 29, 00184 Roma, Italia
TEL/FAX: 39-06-48913949 Email: roma@rk-euro.org

Please contact Rissho Kosei-kai di Rome
**Rissho Kosei-kai of Paris**
**Rissho Kosei-kai of Venezia**

**Rissho Kosei-kai of the UK**
29 Ashbourne Road, London W5 3ED, UK
TEL: 44-20-8933-3247 Email: info@rkuk.org URL: https://www.rkuk.org
Facebook: https://www.facebook.com/rkuk.official
Twitter: https://twitter.com/rkuk_official
Instagram: https://www.instagram.com/rkuk_official

**Rissho Kosei-kai International Buddhist Congregation (IBC )**
166-8537 東京都杉並区和田 2-7-1 普門メディアセンター 3F
Fumon Media Center 3F, 2-7-1 Wada, Suginami-ku, Tokyo 166-8537, Japan
TEL: 03-5341-1230 FAX: 03-5341-1224 URL: http://www.ibc-rk.org

**Published by Rissho Kosei-kai International**